යොමු අංකය : ව/පස/2/34(1).

වයඹ පළාත් සභාව

## වයඹ පළාතේ 1992 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1992.02.05 වැනි දින සම්මත කරන ලදුව 1992.04.03 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

1992 මැයි මස 26 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

## වයඹ පළාතේ 1992 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1992 අංක 01 දරන වයඹ පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඩු නාමය.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන වයඹ පළාතේ 1990 අංක 8 දරන මුදල් ප්‍රඥප්තියේ 37 වැනි වගන්තියේ (ඇ) ඡේදයේ, "මෝටර් රථයක අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක් සඳහා" යන වචන වෙනුවට, "මෝටර් රථයක අයිතිය පැවරීමේ සෑම සාධන පත්‍රයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — වයඹ පළාතේ 1990 අංක 8 දරන මුදල් ප්‍රඥප්තියේ 37 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තියේ (5) වැනි ඡේදයේ (ඊ) අනු ඡේදය වෙනුවට පහත දැක්වෙන අනු ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– — ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

"(ඊ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ සපයනු ලබන නීති ආධාර මත නඩු පවරන, විත්ති වාචක ඉදිරිපත් කරන හෝ මැදිහත් වන තැනැත්තකුවීම පිණිස, එකී නීති ආධාර පනත යටතේ අනුමත කර ඇති නීති ආධාර යෝජනා ක්‍රමයේ පාලකවරයා විසින් හෝ තත් කාර්යය සඳහා යථා පරිදි ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබූ තැනැත්තකු විසින් නැතහොත් ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියළු ලේඛන."

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ, "එහෙත් එවැනි සෑම අවස්ථාවක දී ම, ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස්වරයා විසින් ඒ හේතු ඒ සාධන පත්‍රයේ සහතික කළ යුතු" යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ, "අවලංගු කොට නොමැති අලවන මුද්දරයක්" යන වචන වෙනුවට, "අවලංගු නොකරන ලද්ද වූ අලවන මුද්දරයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වැනි අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වැනි වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ වැනි වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :-

"එක් පළාතකට වඩා වැඩි පළාත් ගණනක පිහිටි දේපළ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු.

43අ. යම් සාධන පත්‍රයක් -

(අ) පළාතේ සීමා තුළ එක් කොටසක් ද, වෙනත් පළාත් එකක් හෝ ඊට වැඩි ගණනක සීමා තුළ අනෙක් කොටස ද පිහිටා ඇති යම් නිශ්චල දේපලක් පැවරීමට අදළ සාධන පත්‍රයක් වන අවස්ථාවක දී, මේ ප්‍රඥප්තිය යටතේ ඒ සාධන පත්‍රය සඳහා අයකළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර, විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම් හෝ, ඒ දේපලෙහි අනෙක් කොටස පිහිටා ඇත්තේ යම් වෙනත් පළාතක හෝ පළාත්වල සීමාතුළද, අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනත් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා තිබේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සළකනු ලැබිය යුතුය;

නැතහොත්

(ආ) එක් නිශ්චල දේපලක් හෝ එකකට වැඩි නිශ්චල දේපල සංඛ්‍යාවක් පළාතේ සීමා තුළ පිහිටා ඇත්ත වූ ද, අනෙක් දේපළ එකක් හෝ වැඩි ගණනක් වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුළ පිහිටා ඇත්තා වූ ද විටක ඒ දේපළ පැවරීමට අදළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රය අලවා ඇත්තේ නම් හෝ, ඒ අනෙක් දේපල පිහිටියේ යම් පළාතක හෝ පළාත්වල සීමා තුළද, ඒ අනෙක් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අයකළ යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර ඒ ප්‍රඥප්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වැනි වගන්තියේ "රුපියල් එකක මුද්දරයක් ඇලිය යුතුය" යන වචන වෙනුවට, "රුපියල් එකක මුද්දර ගැසීම හෝ එකී රුපියලක මුද්දර ගාස්තුවට 40 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ දක්වා ඇති ආකාරයට නියමිත බැංකුවකට ගෙවනු ලැබිය යුතුය." යන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ (1) වැනි උප වගන්තියේ "අධිකරණයකට ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව ද පහත දැක්වෙන කොන්දේසි වේ" යන වචන වෙනුවට, "අධිකරණයක පවරන ලද යම් නීති කෘත්‍යයක දී ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (2) වැනි උප වගන්තියේ "ඒ ලේඛනයෙහි පිටපත් කළ යුතුය" යන වචන වෙනුවට, "ඒ ලේඛනයෙහි පිටපත් කළ යුතු අතර, ඉන්පසු ඒ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ ලේඛනයක් ලෙස සළකනු ලැබිය යුතුය" යන වචන ආදේශ කිරීමෙන්

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම්" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් වෙනත් ආකාරයකට විධිවිධාන සලසා තිබේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

10. 1991 අංක 2 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 5 වගන්තිය මගින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 48 (4) උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වැනි වගන්තියේ "අය කළ යුතුව තිබුණු" යන වචන වෙනුවට, "අය කළ යුතුව තිබුණා වූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වැනි වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :-

"ගාස්තු ගෙවිය යුත්තේ කවුරුන් විසින්ද යනවග.

51. මීට පටහැනිව යම් ගිවිසුමක් තිබුණහොත් මිස, පහත දැක්වෙන තැනැත්තන් විසින් මුද්දර ගාස්තුව ගෙවිය යුතුය :-

(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, පැවරුම්ලාභියා විසින්; සහ
(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වනවිට, ඒ සාධන පත්‍රය පිළියෙල කරන, ලියන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තියේ, "ඔහුගෙන් මුද්දර ගාස්තු අයකර ගැනීමට යටත් වන සියළු ක්‍රියා" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට ඔහු යටත්ව සිටියා වූ සියළු ක්‍රියා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වැනි වගන්තියේ, "මේ ප්‍රඥප්තිය යටතේ ඔහු යටත්ව ඇති" යන වචන වෙනුවට, "මේ ප්‍රඥප්තිය යටතේ ඔහු යටත් විය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය .මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ "මුද්දර ගාස්තු අයකළ යුතු නම් එය සාක්ෂිවල දී" යන වචන වෙනුවට, "මුද්දර ගාස්තු අයකළ යුතු වන්නේ නම් වුවද ඒ සාධන පත්‍රය සාක්ෂිවල දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

"(4) මේ වගන්තියේ කාර්යය සඳහා, "මුද්දර" යන යෙදුමට, අලවන මුද්දරයක් හෝ ලාංඡිත මුද්දරයක් හෝ 40(2) වන වගන්තිය යටතේ යථා පරිදි නිකුත් කරනු ලැබූ මුද්දර ගාස්තු ගෙවූ බවට වූ සහතිකයක් ඇතුළත් වේ."

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වැනි වගන්තියෙහි අළුත් උප වගන්තියක් ඇතුළත් කිරීම.

"(3) මේ වගන්තියේ කාර්යය සඳහා "මුද්දරයක් යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංඡිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40(2) වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ."

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එකී 68 වැනි වගන්තිය ඒ වගන්තියේ 68(1) වැනි උප වගන්තිය ලෙස යළි අංක කිරීමෙන්;
(ආ) එසේ යළි අංක කරන ලද උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(2) (1) වැනි උප වගන්තියේ කාර්යය සඳහා "මුද්දරයක්" යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංඡිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40(2) වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ."

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වැනි වගන්තිය ඉවත් කිරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වැනි වගන්තිය ඉවත් කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වැනි වගන්තියේ (7) වැනි උප වගන්තියේ දැක්වෙන, "මෙහි 5 වැනි උප වගන්තියේ" යන යෙදුම වෙනුවට "මෙහි 6 වැනි උප වගන්තියේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එහි (4) වැනි උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(4) යම් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 වැනි වගන්තියේ (2) වැනි හෝ (3) වැනි උප වගන්තිවල දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවකදී, 40 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් සහතිකය ඒ සාධන පත්‍රයේ පිටපතට යථා පරිදි අලවා ඇති බව හෝ 40 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ දක්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රය කොමසාරිස්වරයා විසින් පිටසන් කර ඇති බව, ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් තම සහතිකය මගින් සහතික කළ යුතුය."

(ආ) එකී (4) වැනි උප වගන්තියට ඉක්බිතිවම ඒ වගන්තියේ (5) වැනි උප වගන්තිය මෙන් බලපාන පරිදි පහත දැක්වෙන උප වගන්තිය එහි ඇතුළත් කිරීමෙන් :-

"(5) මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට, 1991 ජනවාරි 1 වැනි දින සිට මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා වූ කාලය තුළ දී 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධානවලට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව යථා පරිදි මුද්දර ගසා තිබේනම්, ඒ සාධන පත්‍රය හෝ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය."

22. ප්‍රධාන ප්‍රඥප්තියේ XXXI වැනි පරිච්ඡේදයේ ශීර්ෂ පාඨයේ "අධිකරණ දඩ" යන වචන වෙනුවට "අධිකරණ දඩ සහ ගාස්තු" යන වචන ආදේශ කිරීමෙන් ඒ ශීර්ෂ පාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ XXXI වැනි පරිච්ඡේදය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වැනි වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :-

"අධිකරණ දඩ"

99. (1) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් යම් ලිඛිත නීතියක් යටතේ බදු, ගාස්තු හෝ වෙනත් අයකිරීම් අයකර ගැනීම සඳහා පනවනු ලබන දඩ හැර, වැරදි සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් පනවනු ලබන්නා වූ සහ ඒ අධිකරණය වෙත ගෙවනු ලබන්නා වූ දඩ මුදල් අතුරෙන්, යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩ මුදල්වලින් ගෙවිය යුතු යයි අධිකරණය විසින් කරනු ලබන යම් විධානයකට යටත්ව, ඒ සියළු දඩ මුදල් පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(2) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් විසින් එකතු කරනු ලබන සියලු අධිකරණ ගාස්තු මෙම පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

24. 1991 අංක 2 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 9 ඡේදය මගින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වැනි වගන්තියේ "ඉන් කිසිවක් සඳහා භාවිතා කළයුතු ආකෘති සහ ගණුදෙනු ලේඛනය" යන වචන වෙනුවට, "ඉන් කිසිවක් සම්බන්ධයෙන් වූ ගණුදෙනු සඳහා භාවිතා කළයුතු ආකෘති පත්‍ර සහ ලේඛනය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) "මේ ප්‍රඥප්තියෙහි" යන වචන වෙනුවට,
"මේ ප්‍රඥප්තියෙහි" යන වචන ආදේශ කිරීමෙන්;
(ආ) "කක්ෂේරුකරු" යන්නෙහි අර්ථ නිරූපනයෙහි
"ප්‍රඥප්තියේ" යන වචනය වෙනුවට "ප්‍රඥප්තියේ" යන වචන ආදේශ කිරීමෙන්;
(ඇ) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථ නිරූපනයෙහි -

(i) (1) වැනි ඡේදයේ "ප්‍රඥප්තියේ" යන වචනය වෙනුවට "ප්‍රඥප්තියේ" යන වචනය ආදේශ කිරීමෙන්;
(ii) එහි (2) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(2) ප්‍රඥප්තියේ කාර්යය සඳහා තමා විසින් දෙනු ලබන බලය පැවරීම් ලිපියෙහි නියමිතව සඳහන් කරුණු සම්බන්ධයෙන් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු විසින් කලින් කල ලිඛිතව බලය පවරනු ලැබුවා වූ ද, සමාගම් (විගණකවරුන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කර ඇති පුද්ගලයකු වන්නා වූ යන කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නා වූ හෝ දේශීය ආදායම් පනතේ කාර්යය සඳහා 1979 අංක 28 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ තැනැත්තකු වන්නා වූ ද යම් පුද්ගලයෙක් අදහස් වේ."

(ඈ) "අය කළ යුතු" යන්නෙහි අර්ථ නිරූපනයෙහි, "ලියා අත්සන් කරන ලද" යන වචන වෙනුවට, "ලියා අත්සන් කළ" යන වචන ආදේශ කිරීමෙන්,
(ඉ) "මුද්‍රාංකනය" යන්නෙහි අර්ථ නිරූපනයේ "යම් තහඩු මුද්‍රණයක්, අකුරු ආයුධයක් හෝ උපකරණයක්" යන වචන වෙනුවට, "යම් තහඩුවක්, ලාංඡනයක්, මෙවලමක් හෝ උපකරණයක්"; යන වචන ආදේශ කිරීමෙන්;
(ඊ) "ලේඛනය" යන්නෙහි අර්ථ නිරූපනයේ "බැඳුම්කරයක් හෝ ඇප පත්‍රයක්" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියළු වචන ඉවත් කොට ඒ වෙනුවට, "බැඳුම්කරයක් හෝ ඇපකරයක් ඇතුළත් වේ" යන වචන ආදේශ කිරීමෙන්;
(උ) "නිසි පරිදි මුද්දර ගසන ලද" යන්නෙහි අර්ථ නිරූපනයේ, "පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව ද" යන වචන වෙනුවට, "පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව හෝ මුද්දර ගාස්තු ගෙවූ බව දැක්වෙන සහතිකයක් ඒ සාධන පත්‍රයට අමුණා ඇති බව ද" යන වචන ආදේශ කිරීමෙන්;
(ඌ) "සාධන පත්‍රය" යන්නෙහි අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් :-

"සාධන පත්‍රය" යන්නට, පළාත තුළ යම් නිශ්චල දේපළක් පැවරීමට හෝ පළාත තුළදී කරනු ලබන යම් මෝටර් වාහනයක් පැවරීමට අදළ සෑම ලේඛනයක්ම ඇතුළත් වේ.

(එ) "තැනැත්තා" යන්නෙහි අර්ථ නිරූපනයේ "පුද්ගල මණ්ඩලයක්" යන වචන වෙනුවට "පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්" යන වචන ආදේශ කිරීමෙන්;
(ඒ) "ඇටෝර්නි බලය" යන්නෙහි අර්ථ නිරූපනයේ "තැනැත්තා වෙනුවෙන්" යන වචන වෙනුවට "තැනැත්තා වෙනුවෙන් සහ" යන වචන ආදේශ කිරීමෙන්;
(ඔ) "කාර්තුව" යන්නෙහි අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන් :-

"පැවරුම" යන්නෙන් විකිණීමක් අදහස් වන අතර, මියගිය තැනැත්තකුගේ බූදලයේ යම් දේපළක් ඊට ප්‍රතිලාභී හිමිකම ඇති යම් තැනැත්තකු වෙත හෝ මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ එක්කොට ඇති භාරකරුවකු වෙත, එකී මියගිය තැනැත්තාගේ බූදලයේ පොල්මාකරුවකු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ප්‍රතිෂ්ඨාවකින් තොරව තෑගි කිරීමක්, හුවමාරු කිරීමක්

හෝ පැවරීමක් හෝ එවැනි භාරකරුවකු විසින් ප්‍රතිලාභියකු වෙත කරනු ලබන තෑගි කිරීමක්, නුවමාරු කිරීමක් හෝ පැවරීමක් හෝ මියගිය භාරකරුවකුගේ පොල්මකාරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ භාරකරුවකු විසින් උත්තරජීවී භාරකරුවකු වෙත හෝ අළුත් භාරකරුවකු වෙත ප්‍රතිෂ්ඨාවසින් තොරව කරනු ලැබූ පැවරීමක් ඇතුළත් වන අතර, පොදුවේ දරන යම් ඉඩමක් බෙද වෙන්කර ගැනීමේ ඔප්පුවක් හෝ පැවරීමක් සඳහා වූ ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ;"

(ඊ) "භාරකරු" යන්නෙහි අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපනය ඇතුළත් කිරීමෙන් :-

" "වටිනාකම" යන්න -

(අ) තෑගි කරනු ලැබූ නිශ්චල දේපළක් නොවන යම් දේපළක් සහ යම් දිනයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, තක්සේරුකරුගේ මතය අනුව එදිනට විවෘත වෙළඳ පොලේ දී ඒ දේපළ ලැබිය හැකි මිළ ගණන් අදහස් වේ.

(ආ) පැවරුම්කරු විසින් 1977 මාර්තු 31 වැනි දින දී හෝ ඊට පෙර අත්කර ගන්නා ලද්ද වූ ද, පසුව තෑගි කරනු ලැබුවා වූ ද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට -

(i) ඒ දේපළ 1977 මාර්තු 31 වැනි දින දී විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතය අනුව ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිළට, 1977 මාර්තු මස 31 වැනි දිනෙන් පසු සහ ඒ දේපළ එසේ තෑගි කළ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපළට යම් වැඩිදියුණු කිරීමක්, වෙනස් කිරීමක් හෝ අමුතුවෙන් එකතු කිරීමක් කර තිබුණේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල; හෝ

(ii) ඒ දේපළ තෑගි කරන්නට යෙදුනු සාධන පත්‍රයේ දිනයේ දී විවෘත වෙළඳපොලේ දී ඒ දේපළ විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතයට අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිළ

යන දෙකින් අඩු මුදල අදහස් වේ;

(ඇ) පැවරුම්කරු විසින් 1977 මාර්තු මස 31 වැනි දිනෙන් පසු අත්කර ගන්නා ලදුව පසුව තෑගි කළ යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට -

(i) ඒ දේපළ ඒ පැවරුම්කරු විසින් අත්කර ගන්නා ලද දිනයේ දී විවෘත් වෙළඳපෙලේ දී ඒ දේපළ විකුණන ලද නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිළට, ඒ දේපළ එකී පැවරුම්කරු විසින් අත්කර ගැනීමෙන් පසු සහ ඒ දේපළ තෑගි කිරීමේ සාධන පත්‍රයේ දිනට පෙර ඒ දේපළට කරන ලද යම් වැඩි දියුණු කිරීමක්, වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් වේනම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල; හෝ

(ii) ඒ දේපළ තෑගි කරන්නට යෙදුනු සාධන පත්‍රයේ දිනයේ දී විවෘත වෙළඳපෙලේ දී ඒ දේපළ විකුණන ලද්දේ නම්, තක්සේරුකරුගේ මතයට අනුව, ඒ දේපළ සඳහා ලැබිය හැකිව තිබුණු මිළ

යන දෙකින් අඩු මුදල අදහය් වේ."

**26. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.** අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**06-444/19**